| | |
|---|---|
| කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර | බහුවරණ ප්‍රශ්න -සංග්‍රහය |
| | විෂය-ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |
| සකස් කළ ගුරුභවතාගේ නම - එම්.පී අරන්දර මිය<br>පාසල - ර/ පාතකඩ බෞද්ධ මහා විද්‍යාලය | ශ්‍රේණිය - 10<br>පාඩම - ගිණුම්කරණ සමීකරණ |

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**1)** ගිණුම්කරණ සමීකරණයේ වැරදි සම්බන්ධතාව වනුයේ
- i. වත්කම් = හිමිකම් + වගකීම්.
- ii. හිමිකම් = වත්කම් - වගකීම්.
- iii. වත්කම් = වගකීම් + හිමිකම්.
- iv. වගකීම් = හිමිකම් + වත්කම්.

2) රු 20 000 ක බඩු තොගයක් රු.50 000 කට ණයට විකිණීමට අදාළව ගිණුම්කරණ සමීකරණයට වන ශුද්ධ බලපෑම වනුයේ,

**වත්කම් = හිමිකම් + වගකීම්**

- I. + 20 000 = -30 000 +50 000
- II. + 50 000 = +50 000
- III. + 80 000 = +30 000 +50 000
- IV. + 30 000= +30 000

3) 2020.1231න් ගිණුම් වර්ෂය අවසාන වන ව්‍යපාරයක වත්කම් රු.500 000 ක්ද වගකීම් රු. 150 000 ක්ද වේ නම් එහි හිමිකම වනුයේ,
- I. රු.350 000
- II. රු. 650 000
- III. රු. 500 000
- IV. රු. 450 000

4) පහත අවස්ථා වලින් හිමිකම වෙනස් වන වස්ථාවක් නොවන්නේ,
- I. අමතර ප්‍රාග්ධනය යෙදීම
- II. ආදායමක් ඉපයීම
- III. බඩු තොගයක් ණයට ගැනීම
- IV. වියදමක් දැරීම

5) හිමිකම අඩුවීමට බලපාන ගනුදෙනුවක් නොවන්නේ,
- I. මුදල් ගැනිලි සිදුකිරීම
- II. වියදම් දැරීම
- III. අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ ණය පියවීම
- IV. බඩු තොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම

6) හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුවක් නොවන්නේ,

  I. අමතර ප්‍රාග්ධනය යෙදීම
  II. ආදායමක් ඉපයීම
  III. ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් මුදල් ගැනීම
  IV. අයිතිකරු මුදල් යොදා ව්‍යාපාරයට බඩු තොගයක් ගැනීම

7) වත්කම් = හිමිකම් + වගකීම්

+25 000 = +25 000

මෙම ප්‍රතිඵලය ලැබීමට සිදු වී ඇති ගනුදෙනුවකි.

  I. රු. 40 000ක් වටිනා බඩු තොගයක් රු. 65 000කට විකිණීම
  II. රු. 25 000ක බඩු තොගයක් මිලට ගැනීම
  III. රු. 25 000ක ණයක් ගැනීම
  IV. රු. 25 000ක ලී බඩු ණයට ගැනීම

8) වත්කම් = හිමිකම් + වගකීම්

වැඩි වීම වැඩි වීම

මෙම බලපෑම ඇතිකරන ගනුදෙනුවකි,

  I. බඩු තොගයක් මුදලට ගැනීම
  II. බඩු තොගයක් ණයට ගැනීම
  III. ආදායමක් ඉපයීම
  IV. අමතර ප්‍රාග්ධනය යෙදවීම

9) ව්‍යාපාරයක ගිණුම් වර්ෂය ආරම්භක දිනට ප්‍රාග්ධනය රු. 300 000ක් වූ අතර වර්ෂය තුළ අයිතිකරු රු. 50 000ක මුදලක් යොදා ඇත.වර්ෂයේ ආදායම රු. 100 000ක් සහ වියදම රු. 40 000ක් නම් වර්ෂය අවසාන දිනට හිමිකම වනුයේ,

  I. රු. 450 000
  II. රු. 410 000
  III. රු. 350 000
  IV. රු. 360 000

10) කසුන්ගේ ව්‍යාපාරයේ 2020 .12.31 දිනට හිමිකම රු. 850 000කි. වර්ෂය තුළ අමතර ප්‍රාග්ධනය යෙදීමක් හෝ ගැනිලි සිදු කිරීමක් නැත. උපයා ඇති අලාභය රු 50 000කි. වර්ෂය ආරම්භක දිනට හිමිකම වන්නේ,

  I. රු. 900 000 කි.
  II. රු. 850 000 කි.
  III. රු. 800 000 කි.
  IV. රු. 750 000 කි.

**<u>පිළිතුරු පත්‍රිකාව</u>**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 4 | 6 | 3 |
| 2 | 4 | 7 | 1 |
| 3 | 1 | 8 | 2 |
| 4 | 3 | 9 | 2 |
| 5 | 3 | 10 | 1 |